සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 9 - 2019

**නම/විභාග අංකය :......................................** **බුද්ධ ධර්මය** **කාලයඃ පැය 02යි.**

**සැලකිය යුතුයි :**

- ✳ පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්ණයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.
- ✳ දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) මුගලන් තෙරණුවෝ බුදුරදුන් වෙත වැඩම කර අවසර ගෙන පිරිනිවන් පෑවේ,

1. නාලක ගමේ ය. 2. බේළුව ගමේ ය.
3. කාලසිලාවේ ය. 4. භෝග නගරයේ ය.

(2) වර්තමානයේ සහකම්පනය යනුවෙන් හැඳින්වෙන්නේ සතර බ්‍රහ්ම විහරණ අතර ඇති,

1. මෙත්තාව ය. 2. මුදිතාව ය.
3. කරුණාවයි. 4. උපේක්ෂාවයි.

(3) හේතුඵල දහම අනුව කරුණු කාරණා සිදුවන ආකාරය පිළිබඳ තොරතුරු දක්වෙන සූත්‍රයක් වන්නේ,

1. මහා නිදාන සූත්‍රය 2. මංගල සූත්‍රය
3. වසල සූත්‍රය 4. කාලාම සූත්‍රය

(4) ගේහසික ශීලය ලෙස හඳුන්වන්නේ,

1. සාමණේර සීලයයි. 2. දස සීලයයි.
3. අෂ්ඨාංග ශීලයයි. 4. පංච ශීලයයි.

(5) බුදු දහමට අනුව උසස් ම ලාභය වන්නේ,

1. නිරෝගී කම ය. 2. නිවන ය.
3. ධනය ය. 4. සතුට ය.

- **අංක 06 - 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන තුළ යොදන්න.**

(6) කෙලෙස් හරිත සමාජයක ක්ලේශයන්ට වසඟ නොවීම පද්මාකාර ජීවිතය ය. ( )

(7) අංශ තුනකින් හෙවත් තුන් ආකාරයකින් සිල්වත් වීම ත්‍රිශික්ෂාවයි. ( )

(8) ශාසනික ගැටළු විසඳීම සඳහා සංගායනා පැවැත්වීම බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළ සේක. ( )

(9) බුද්ධ ප්‍රතිමා නිර්මාණය ආරම්භ වූයේ ක්‍රි. ව. 1 වන සියවසේදී පමණ ය. ( )

(10) මිච්ඡා ආජීවය යනු නිවැරදි දිවි පැවැත්ම ය ( )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

**(දළදා පූජාවලිය, ආගම ශ්‍රද්ධාව, වෙසක් , පැවිදි උතුමන්, සසඳාවත, අධිගම ශ්‍රද්ධාව, ඇසල, ගිහියන්, මහා හංස, ගුත්තිලය)**

(11) සංඝ රත්නය ලොවට දයාද වන්නේ ........................................................................ පෝ දිනක ය.

(12) මෛත්‍රී සහගතව කථා කිරීම ........................................................................ ගේ යුතුකම කි.

(13) ජාතක පාලියෙහි ඇතුළත් ........................................................................ ජාතකයෙහි දසරාජ ධර්මය දක්වේ.

(14) මාර්ග ඵලාදිය ලබාගත් මහෝත්තමයන් වහන්සේලා තුළ උපදින ශ්‍රද්ධාව වන්නේ, ........................................................ ය.

(15) ........................................................................ පොළොන්නරු යුගයේ රචිත ග්‍රන්ථය කි.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු තෝරා යා කරන්න.**

| | |
|---|---|
| (16) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය | පරිත්‍යාගය |
| (17) සම්මා සති | කථාවත්ථුප්‍රකරණය |
| (18) දසරාජ ධර්මයකි | කංස කූට |
| (19) තෙවන ධර්ම සංගායනාව | ධම්මානුපස්සනා |
| (20) මිච්ඡා ආජීව | අෂ්ඨ ගරු ධර්ම |

(ල. $2 \times 20 = 40$)

## II කොටස

- පළමු වන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) ආනාපානසති භාවනාවට සූදානම් වීමේ දී කළ යුතු කාර්යයන් 2 ක් ලියන්න.

(ii) මහා ප්‍රජාපතී ගෝතමී දේවියගේ දෙමාපියන් නම් කරන්න.

(iii) සම්මා දිට්ඨියෙහි ආකාර 2 දක්වන්න.

(iv) රජගහ නුවර වාසය කළ ශාස්තෘන් හයදෙනෙකු විය. ඉන් දෙදෙනෙක් නම් කරන්න.

(v) ''දුල්ලභංච මනුස්සත්තං'' මෙහි අර්ථය දක්වන්න.

(vi) දුම් පානය නිසා වැළඳෙන රෝග 2 ක් ලියන්න.

(vii) දෙවන ධර්ම සංගායනාවේ කාරක සභාවට අයත් වූ ස්වාමීන් වහන්සේලා දෙදෙනෙක් නම් කරන්න

(viii) අනුරාධපුර යුගයේ රචිත නාමය පමණක් ඉතිරි වූ ග්‍රන්ථ 2 ක් නම් කරන්න.

(ix) ධාර්මික ධනෝපායන මාර්ග 2 ක් නම් කරන්න.

(x) මාඝාත ආඥාව යනු කුමක් ද? එය පැනවූ පාලකයා කවුද?

(ල. $2 \times 10 = 20$)

(2) (i) බහුශ්‍රැත බව යනු කුමක් ද? (ල. 2)

(ii) බුදුරජාණන් වහන්සේ අගතිගාමී නොවූ බවට නිදසුන් 3 ක් දෙන්න. (ල. 3)

(iii) කාරුණික බව බුද්ධ චරිතයෙන් ප්‍රකට වූ අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(3) (i) බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ ගිහි නාමය කුමක් ද? (ල. 2)

(ii) බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන් විසින් කළ ශාසනික සේවා 3 ක් ලියන්න. (ල. 3)

(iii) බලංගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 5 ක් ලියන්න. (ල. 5)

(4) (i) උපතිස්ස පිරිවැජියා සෝවාන් ඵලයට පත්වූයේ කුමන ගාථාවක් ඇසීමෙන් ද? (ල. 2)

(ii) පටිච්ච පමුප්පාදය ඇතුළත් කෙටි සූත්‍රය සිංහල අර්ථයසමග ලියන්න. (ල. 3)

(iii) පටිච්ච සමුප්පාදය ඇසුරින් ඔබට ඇති වූ ගැටළුවක් විග්‍රහ කරන ආකාරය දක්වන්න. (ල. 5)

(5) (i) දඹදෙණි යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ 2 ක් නම් කරන්න. (ල. 2)

(ii) ජාතක කථා ඇසුරෙන් රචිත සාහිත්‍ය ග්‍රන්ථ 3 ක් ලියන්න. (ල. 3)

(iii) සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති පරිශීලනයෙන් මෙරට ජන ජීවිතයේ සිදු වූ වෙනස පහදන්න. (ල. 5)

(6) (i) දස රාජධර්මවල පරිත්‍යාගය යනු කුමක් ද? (ල. 2)

(ii) ''දානං සීලං පරිච්චාගං'' ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 3)

(iii) දස රාජ ධර්ම සුරකින පාලකයකු සහිත රටක දැකිය හැකි ලක්ෂණ 5 ක් ලියන්න. (ල. 5)

(7) පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) ඉවසීම

(ii) සම්මා ආජීව

(iii) අත්තූපනායික ධර්ම පර්යාය

(iv) අටලෝ දහම

(ල. $2 \times 5 = 10$)